# නපුරු වරුණිගේ කතාව



චෙනුලි තෙහාරා නිම්තකි

නපුරු වරුණිගේ කතාව

චෙනුලි තෙහාරා නිම්තකි

මලී සහ පුංචි බළලු පැටියා - 2023.10.20

ISBN 978-624-208-321-6

# පිදුම

ආදරණීය විදුහල්පතිතුමියටත්,

අකුරු කියාදෙන පන්තිභාර ගුරුතුමියටත්,

පොත ලිවීම සඳහා උපදෙස් ලබාදුන් සියලුම ගුරු දෙමාපියන්ටත්,

මාගේ දෙමාපියන්ටත්,

මෙම පොත පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටෙ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකෝමත් එක කාලෙක වරුණි කියලා ළමයෙක් හිටියා. එයා හරිම නරකයි. එයා ඉස්කෝලෙ යද්දිත් ළමයින්ට නිතරම කරදර කරනවා.



එයා නරක වැඩ කරන නිසා එයාගෙ අම්මටයි, තාත්තටයි ගොඩක් දුක හිතුණා.



එයා එක දවසක් නරක වැඩක් කරනවා විදුහල්පතිතුමා දැක්කා. විදුහල්පතිතුමාට කේන්ති ගියා. ඒ හින්දා විදුහල්පතිතුමා වරුණිට විදුහල්පති කාර්යාලයට එන්න කිවුවා.



ඒත් වරුණි විදුහල්පති කාර්යාලයට ආවේ නෑ. විදුහල්පතිතුමා ගොඩක් වෙලා බලා ගෙන හිටියා.

ඒත් තාම වරුණි ආවේ නෑ.



විදුහල්පතිතුමා වරුණිගෙ දෙමාපියන්ට කතා කළා. දෙමාපියෝ ඉස්කෝලෙට ආවා. විදුහල්පතිතුමා වරුණිගෙ දෙමාපියන්ව දැක්කා. විදුහල්පතිතුමා ඒ අයව විදුහල්පති කාර්යාලයට කැඳෙව්වා.



ඊට පස්සෙ දෙමාපියන්ගෙන් ප්‍රශ්න ඇහුවා. ''වරුණී ගෙදරදි මොනාද කරන්නේ?'' විදුහල්පතිතුමා ඇහුවා. එයාලා කිව්වේ මෙහෙම, විදුහල්පතිතුමානි අපේ දුව ගෙදරදීත් දඟ වැඩ කරනවා. අපි කොච්චර කිවුවත් එයා අපි කියන දේ අහන්නේ නෑ.



විදුහල්පතිතුමා දුක් වුණා. එයා කල්පනා කරලා මෙහෙම කිවුවා. ''අපි ළමයින්ට කියමු වරුණිට හොඳින් කතා කරලා සෙල්ලමට අරගෙන හොඳ යාළුවෙක් කරගන්න කියලා''.



පහුවදා වරුණි ඉස්කෝලෙ යද්දි යාළුවෝ එයාට හොඳට කතා කලා. වරුණිට හරිම පුදුමයි. එයා බැලුවා මට කවදාවත් මෙයාලා මෙහෙම කතා කරලා නෑ. අද කොහොමද එහෙම කරන්නේ කියලා.



දවසින් දවස ගත වුණා. වරුණිට තේරුම් ගියා එයාගේ වැරැද්ද මොකක්ද කියලා. එයාට ලැජ්ජා හිතුණා. එයා ආය කවදාවත් නරක වැඩ කළේ නෑ.



එයා යාළුවොත් එක්ක සමගියෙන් ඉන්න පුරුදු වුණා.





**පසුවදන**

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔනැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්